# හම්බන්තොට දිස්ත්‍රික්කය සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත උරුම කළමනාකරණය

ඩබ්.ඩී. තරංගා සඳමාලි[53]

---

හම්බන්තොට දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළ කලාප ප්‍රදේශයේ ශුෂ්ක කලාපයේ පිහිටා ඇත. වසර දහස් ගණනකට පෙර ජනාවාසකරණයට ලක්ව ඇති මෙම භූමියේ වර්තමානයේ වර්ග කිලෝමීටර 2609 ක් වූ භූමියක පැතිර ඇත. හම්බන්තොට ජනයා සාම්ප්‍රදායික කර්මාන්ත ගණනායක නිරත වේ. සම්ප්‍රදායික ශිල්ප කර්මාන්ත වශයෙන් හඳුන්වනු ලබන්නේ පාරම්පරික ශිල්පීය දැනුම භාවිතයට ගනිමින් කාර්මික භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාග් හා මූල ඓතිහාසික යුගයෙන් ආරම්භ වූ ජනාවාස ඓතිහාසික අවධිය වන විට විවිධ ශිල්පීය දැනුම භාවිත කර කුඹල්, ස්වර්ණාභරණ, කම්මල් , ආදී කර්මාන්ත පශ්චාත් ඓතිහාසික යුගයෙන් පසු ව කොහු, කිතුල්, පන් කෙඳි, පේෂ, ලී කැටයම්, සිප්පි, බීරළු, දේශීය ඖෂධ, ලාක්ෂා, වාදන භාණ්ඩ, බටපතුරු කර්මාන්ත සිදුකර මින් වර්තමානය දක්වා අදාළ කර්මාන්ත පවත්වා ගෙන එනු ලැබේ. වර්තමානය වන විට විවිධ අභියෝගයන් හේතු කොට කර පුරාණ උරුමය නිසි කළමනාකරණයට ලක්කිරීමේ අවශ්‍යතාවය පැනනැගී ඇත. අතීත මානව ක්‍රියාකාරකම් සංස්කෘතික උරුමයට අයත් වේ. වර්තමානය වන විට සාම්ප්‍රදායික සංස්කෘතික උරුමය විනාශවීමේ තත්ත්වයට මුහුණ පා ඇති අතර එසේ අභියෝගයන්ට ලක්වී ඇති සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත ගැටළු හඳුනාගනිමින් අනාගතය වෙනුවෙන් තව දුරටත් ඒවා ආරක්ෂා කරලමින් උරුම කළමනාකරණය කිරීම මෙ මගින් අපේක්ෂා කරයි. සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත උරුම කළමනාකරණය සිදු කිරීමේදී ප්‍රධාන අරමුණු සහ පරමාර්ථයන් ඉටුකර ගනිමින් අනාගත පැවැත්ම තහවුරු කිරීම ප්‍රධාන අරමුණු විය යුතු ය. එ මගින් සැලසුම්කරණය, සංවිධානකරණය, නායකත්වය සහ පාලනය කිරීම මෙම පර්යේෂණයෙන් හඳුනා ගැනීම අපේක්ෂාව වේ. අනතුරු ව සීමිත සම්පත් හරහා කර්මාන්තයන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට අදාළ වන ක්‍රියාමාර්ග සඳහා පියවර ගත යුතු ය. ඒ අනුව සැලසුම් සකස් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා අරමුණු පරමාර්ථ ස්ථාපිත කර ගැනීමේ දී උරුමයන්හි සුවිශේෂතා හඳුනා ගැනීම, කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, අදාළ කළමනාකරණ සැලැස්මක් සකස්කිරීම හෙවත් උපක්‍රම යෝජනා කිරීම, උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, ඇගයීම සහ පසු විපරම් කිරීම හරහා සංස්කෘතික උරුම කළමනාකරණය සිදු කළ හැකි ය. ඉහත ක්‍රමවේදයන් ආශ්‍රිත ව නිවැරදි දත්ත ඒකරාශී කර ගනිමින් දත්ත විශ්ලේෂණය කිරීම ඉතා වැදගත් වෙයි. වර්තමානය තෙක් නොනැසී වෙනස්කම් සඳහා භාජනය වූ සංස්කෘතික උරුමයන් ලෙස සාම්ප්‍රදායික කර්මාන්තයන් තව දුරටත් නිසි කළමනාකරණ ක්‍රමවේද යටතේ ඉදිරියට පවත්වා ගෙන යාමට හැකි වනු ඇත.

ප්‍රමුඛ පද : සාම්ප්‍රදායික කර්මාන්ත, උරුම කළමනාකරණය, සංස්කෘතික උරුමය, අභියෝග

---

[53] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, Sandamai200@gmail.com.